# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,683 - 2010 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා - 2010.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 2034 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 2037 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 2038 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 දෙසැම්බර් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


2033- B 080176—3,350 (2010/12)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 644

D/22/NY/458.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාණ්ඩර් (අවි) සේනසිගේ ජුඩ් ෂෙනායි නිරන්ජන් සිල්වා, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0518

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

12-84

---

2010 අංක 645

D/RF/824/NY/1/9.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2009 මාර්තු මස 01 වැනි දින සිට තාවකාලික ලුතිතන්-කොමාන්ඩර් (නාසේ) වශයෙන් :*

ලුතිතන් (නාසෙ) මුනිපුරගේ උදයවීර කුමාරණතුංග, එන්ආර්පී 1270, ශ්‍රීලංනාහ

*2009 අප්‍රේල් මස 04 වැනි දින සිට තාවකාලික ලුතිතන්-කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිතන් (වි) ඉලංගසිංහ බ්‍රාහ්මණ මුදියන්සේලාගේ මාලිකා තිලක්ෂිණි තිලකරත්න, එන්ආර්එල් 1401, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

12-85

---

2010 අංක 646

D/VF/193/NY/1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2010 ජනවාරි මස 01 සිට කපිතාන් වශයෙන් :*

කොමාණ්ඩර් (තාවකාලික කපිතාන්) අප්පුහාමිගේ හේරත්බංඩා, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑක්ස් 5071

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

12-82

---

2010 අංක 647

D/VF/193/NY/1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2009 ජූලි මස 30 වැනි දින සිට ලුතිතන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිතන් අලහේන්ද්‍ර ආරච්චිගේ නාලිකා තුෂන්ති පෙරේරා, එන්වීඑක්ස් 5273, ශ්‍රීලංස්වේනාහ

*2009 දෙසැම්බර් මස 01 වැනි දින සිට ලුතිතන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිතන් වීරසිංහ මුදියන්සේලාගේ කෝසල රවිනාත් වීරසිංහ, එන්වීඑක්ස් 5247, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් හේරත් බංඩාර මුදියන්සේලාගේ මංගල විජේරත්න, එන්වීඑක්ස් 5260, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් දිසානායක මුදියන්සේලාගේ නිහාල් දිසානායක, එන්වීඑක්ස් 5261, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් කෝණාර මුදියන්සේලාගේ දයානන්ද, එන්වීඑක්ස් 5262, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් තිස්සකුට්ටි ආරච්චිගේ පියරත්න, එන්වීඑක්ස් 5264, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් මල්ලිකාආරච්චිගේ දොන් වසන්ත, එන්වීඑක්ස් 5267, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් සෙනරත් පතිරණගේ නිල්මිණී සුජීවා, එන්වීඑක්ස් 5268, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

12-81

2010 අංක 648

D/VF/194/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2007 ජුනි මස 26 වැනි දින සිට ලුතිතන්, තොරතුරු තාක්ෂණ (ස්වේච්ඡා) වශයෙන් :*

එරන්ද මාලක චන්ද්‍රදාස, එන්වීටී 5429

*2007 ජුනි මස 26 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් තොරතුරු තාක්ෂණ (ස්වේච්ඡා) වශයෙන් :*

හොඳමුනි දේවේන්ද්‍ර රුෂාන් මෙන්ඩිස් කරුණාරත්න, එන්වීටී 5430

*2007 ජුනි මස 26 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් වශයෙන් :*

කෝරලේ ලියනගේ ශානිකා දිල්රුක්ෂි ලියනගේ, එන්වීඑක්ස් 5431

*2007 ඔක්තෝබර් මස 15 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් වශයෙන් :*

කංකානම් ගමගේ ශ්‍රිමන්ත නිර්බාධ, එන්වීඑක්ස් 5433
මාධව ගජනාත් වන්නිආරච්චි, එන්වීඑක්ස් 5434
රෝහණ සුමනසේකර, එන්වීඑක්ස් 5435
හේරත් මුදියන්සේලාගේ කීර්ති බණ්ඩාර, එන්වීඑක්ස් 5436
කොඩිතුවක්කු ආරච්චිලාගේ ලලිත් කොඩිතුවක්කු, එන්වීඑක්ස් 5437
මැදගෙදර චින්තක සඳරුවන් කොඩිතුවක්කු, එන්වීඑක්ස් 5438
මඩම්පැල්ලේ ගුණරත්න මුදියන්සේලාගේ සම්පත් පද්ම කුමාර ගුණවර්ධන, එන්වීඑක්ස් 5439
දොන් චන්දන වනිගරත්න, එන්වීඑක්ස් 5440
සෙනරත් රත්නායක උපුල් චමින්ද රත්නායක, එන්වීඑක්ස් 5441
අලහකෝන් මුදියන්සේලාගේ රොෂාන් බංඩාර අලහකෝන්, එන්වීඑක්ස් 5442
මොහමඩ් නිලාම් අන්වර්, එන්වීඑක්ස් 5443
රසික ඉන්දික දේවේන්ද්‍ර, එන්වීඑක්ස් 5444
රයිගම ආචාරිගේ අසංක සම්මි කුමාර, එන්වීඑක්ස් 5445
දිසානායක මුදියන්සේලාගේ කීර්තිරත්න බංඩාර, එන්වීඑක්ස් 5446
අත්තනායකගේ රංග මොහාන් කුමාර, එන්වීඑක්ස් 5447
සුන්ද්‍රා වඩුගේ වෙසිල් ප්‍රසාත්, එන්වීඑක්ස් 5448
චන්දන රුවන් ගමගේ, එන්වීඑක්ස් 5449
ගනේගෙ රසික විපුල් කුමාර, එන්වීඑක්ස් 5450

*2008 මැයි මස 08 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන් :*

වල්පොලගේ දොන් කපිල නලින් කුමාර වල්පොල, එන්වීඑක්ස් 5479
ඇල්ලේපොල ගෙදර අසේල ප්‍රදීප් කුමාර, එන්වීඑක්ස් 5480
දඹගහ මඩේ ගෙදර ධම්මික තුෂාර ප්‍රේමචන්ද්‍ර, එන්වීඑක්ස් 5481
තෙන්නකෝන් මුදියන්සේලාගේ චන්දිම කපිල සෙනෙවිරත්න, එන්වීඑක්ස් 5482
අර්ෂනිලගේ දොන් ජානක ප්‍රසන්න ප්‍රනාන්දු, එන්වීඑක්ස් 5483
මාන්නපෙරුම මුදියන්සේලාගේ හේමන්ත කුමාරසිරි, එන්වීඑක්ස් 5484
සිරි ජයලත්ගේ සිසිර උදය කුමාර, එන්වීඑක්ස් 5485
හෙට්ටි ආරච්චිලාගේ ප්‍රසන්න රත්න කුමාර, එන්වීඑක්ස් 5486
දිසානායක මුදියන්සේලාගේ නලීන් සමන් කුමාර දිසානායක, එන්වීඑක්ස් 5487
රාජපක්ෂගේ රනිල් ලසන්ත වර්ණසූරිය, එන්වීඑක්ස් 5488
සුරේෂ් විධාන පතිරණ, එන්වීඑක්ස් 5489
පතිරනගේ රවින්ද්‍ර පුෂ්ප කුමාර, එන්වීඑක්ස් 5490
මෙස්ටියගේ දොන් තිශ්ශංක ගුණතිලක, එන්වීඑක්ස් 5492
මංත්‍රී දේවගේ ගාමිණී සරත් කුමාර, එන්වීඑක්ස් 5493
ගුණසේකර සමරසිංහගේ ජනක අනුරාධ, එන්වීඑක්ස් 5496

*2008 මැයි මස 09 වැනි දින සිට උප ලුතිතන් (ස්වේච්ඡා) වශයෙන් :*

වෙන්ගප්පුලි ආරච්චිගේ පද්මසිරි, එන්වීඑක්ස් 5498
මෙරෙඤ්ඤ ලලිත්, එන්වීඑක්ස් 5499
කාලිංග පර්සි අමරසිංහ, එන්වීඑක්ස් 5500
ඇලගෙදර වත්තේගේ නිශාන්ත බංඩාර ගුණරත්න, එන්වීඑක්ස් 5501
වීරක්කොඩිගේ පියසිරි, එන්වීඑක්ස් 5502
එෂාන් උපුල් කුමාර කොඩිප්පිලිආරච්චි, එන්වීඑක්ස් 5503
අංකිලි පිටියේ ගෙදර විජේරත්න, එන්වීඑක්ස් 5504
රත්මලානගේ අතුල නිරංජන් ප්‍රනාන්දු, එන්වීඑක්ස් 5505
අමරසිංහ සිල්වාගේ ඇලෙක් රොහාන් ද සිල්වා, එන්වීඑක්ස් 5506
කෝදාගොඩ පතිරගේ අජිත් ශාන්තප්‍රිය, එන්වීඑක්ස් 5507
තිස්සේදෙණියේ ගෙදර ලක්ෂ්මන් චන්ද්‍රරත්න, එන්වීඑක්ස් 5508
කුමාරගේ ලක්ෂ්මන්, එන්වීඑක්ස් 5509
මුණසිංහ අනුර චන්දන පියතිලක සිල්වා, එන්වීඑක්ස් 5510
මුතුකුට්ටිගේ පියසිරි පෙරේරා, එන්වීඑක්ස් 5511
කොඩිතුවක්කු කන්කානම්ගේ ලලිත් කුමාර, එන්වීඑක්ස් 5512
මධුර ආරච්චිගේ ජයවික්‍රම, එන්වීඑක්ස් 5513
සකලසූරිය මුදියාන්සේලාගේ රණසිංහ බණ්ඩාර, එන්වීඑක්ස් 5514

*2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට උප ලුතිතන් (ස්වේච්ඡා) වශයෙන් :*

අනුරාධ ජයසිංහ, එන්වීඑක්ස් 5515
කොහොඹගහ ගෙදර සුනිල් ප්‍රියදර්ශණ විජේරත්න, එන්වීඑක්ස් 5516
හේනෙගම මුතුකුමාරගේ ප්‍රියන්ත, එන්වීඑක්ස් 5517
රණසිංහ මුදලිගේ මංජුල ප්‍රසන්න රණසිංහ, එන්වීඑක්ස් 5518
චමිලා වුලනී ධයමන්තිනා දූමින්ගු විතානගේ, එන්වීඑක්ස් 5519

*2008 සැපැත්මබර් මස 03 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් (ස්වේච්ඡා) වශයෙන් :*

හේවානායක මුදියන්සේලාගේ වරුණි කෞශල්‍යා, එන්වීඑක්ස් 5520
මෙරිඤ්ඤගේ දොන් කමනි ඉන්දිකා පෙරේරා, එන්වීඑක්ස් 5521
ඕවිටිගල විතානගේ දෝන නිරාශා අමන්ති, එන්වීඑක්ස් 5522
ශෙයි ෆැනෝරා හජ්ජි, එන්වීඑක්ස් 5523
සමරසේකර මුදියන්සේලාගේ දීපානි නිලූකා කුමාරි සෙනවිරත්න, එන්වීඑක්ස් 5524
අගලකඩ ආරච්චිගේ නිලූෂා දමයන්ති, එන්වීඑක්ස් 5525
පහලගෙදර වන්නිආරච්චිගේ ශාමලී ඉන්දිකා, එන්වීඑක්ස් 5526
කංකානම්ගේ ඉනෝකා දමයන්ති, එන්වීඑක්ස් 5527
සිංහලගේ නදීකා සංජීවනී කරුණාතිලක, එන්වීඑක්ස් 5528
පතිරාජ මුදියන්සේලාගේ වසන්ති පතිරාජ, එන්වීඑක්ස් 5529

අතිගරු ජනාධිපතුමාගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී. ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

12-83

2010 අංක 649

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිනිය ඇයගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික විංග් කමාණ්ඩර් නිළයට උසස් කෙරේ :

ස්කොඩ්‍රන් ලීඩර් වලිමුණි කුමුදු මෙන්ඩිස් වීරසේකර (ස්/0509) දන්ත වෛද්‍ය 2007.07.19

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය අමාත්‍යාංශය.

2010 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

12-87

---

2010 අංක 650

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිනිය ඇයගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිළයට උසස් කෙරේ :

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ඉනෝකා ජීවන්ති සේනාරත්න (ඕඩබ්/01073) උපකරණ - 2010.06.27

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12-88

---

2010 අංක 651

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිනිය ඇයගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිළයට උසස් කෙරේ :

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මොනිකා චාමිනි ගමගේ (ඕඩබ්/01068) උපකරණ - 2010.06.27

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12-89

---

2010 අංක 652

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ස්ථිර විංග් කමාණ්ඩර් නිළයට උසස් කෙරේ :

තාවකාලික විංග් කමාණ්ඩර් කැලිස්ටස් රෝහිත ඩයස් ගුණවර්ධන (වී/0313) පාරිපාලන රෙජිමේන්තුව - 2010.06.02

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

12-86

# රජයේ නිවේදන

## ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව

1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

**අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම**

වර්ෂ 1941 අංක 39 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය තුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මාණ්ඩලයීය දෙපාර්තමේන්තුව,

2010 නොවැම්බර් මස 15 වැනි දින,
අංක 80, සාංච්ආරච්චි වත්ත,
අධිකරණ මාවත,
කොළඹ 12.
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 41458 | ජයමහ මුදලිගේ දෝන මේරි ඩොට් වයලට් මිය, අංක 90, බෝපිටිය, පමුණුගම | ගීකියනගේ කාන්ති ප්‍රනාන්දු මිය, අංක 352, උස්වැටකෙයියාව, පල්ලියවත්ත, පමුණුව |
| (02) 41494 | 01. ලියන ආරච්චිගේ ගීනාත් දීප්ති ප්‍රනාන්දු මහතා<br>02 පූජ්‍ය පානදුරේ ධම්මතිස්ස හිමි (ගිහිකළ ලියනආරච්චිගේ මෙන්දිස් ප්‍රනාන්දු) අංක 186, ගාලු පාර, පානදුර | සෝමචන්ද්‍ර ඉන්වෙස්ට්මන්ට් පෞද්ගලික ආයතනය, අංක 40, ගාලු පාර, මහ වස්කඩුව, වස්කඩුව |
| (03) 41627 | කුරුකුලසූරිය ලලින්ද ප්‍රදීප් ලූෂන් ප්‍රනාන්දු වෙනුවෙන් ඇටෝර්නි බලකාරිය වීරක්කොඩි ආරච්චිගේ දෝන ග්‍රේෂ් අයිරින් පැට්‍රිෂියා මිය, අංක 175, බණ්ඩිරිප්පුව පාර, හාල්දඬුවන, ලුණුවිල | සීමාසහිත සමගි එස්ටේට් ඇන්ඩ් ෆිනෑන්ස් (පුද්) සමාගම, අංක 85, හලාවත පාර, වෙන්නප්පුව |
| (04) 41696 | සුදුවා දේවගේ අනුෂ්කා ප්‍රියංගනී මිය, ඒ. එස්. එම්. සී. අත්තනායක බාරේ, අංක 115/බී, මාළිද, කපුගොඩ | රූපසිංහ ආරච්චිගේ දොන් වරුණ සම්පත් මයා, අංක 167/ඒ, ජයන්ති හන්දිය, මිරිස්කන්ද වත්ත, දොම්පේ |
| (05) 41725 | වර්ණකුලසූරිය ඉච්චම්පුල්ලිගේ ජයශ්‍රී ඔගස්ටස් රොහාන් ප්‍රනාන්දු මයා, අංක 320, රොහාන් විලා, නැගෙනහිර නයිනමඩම, නයිනමඩම | අඹගහගේ ටිරොන් ප්‍රභාත් සුරංග ප්‍රනාන්දු මයා, පේරගස් හන්දිය පාර, කොලින්ජාඩිය, වෙන්නප්පුව |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (06) 41731 | රාජකරුණා දේවයලාගේ සෝමාවතී මිය, අංක 55. රම්බොඩගල්ල, පානගමුව | හෙට්ටිවාන දේවගේ මැංචිනා චන්ද්‍රසීලි මිය, ගල්ලව, ඊරියගල්ල |
| (07) 41734 | කුනන්කාර ගෙදර කරුණාදාස මයා, අංක 143, දංගමුව, මාරස්සන | එගොඩ ගෙදර ඉන්දික පද්මසිරි මයා, අපොන්සුවත්ත, මයිලපිටිය |
| (08) 41735 | කංකානම් පතිරණගේ තුෂාර සංජීව මයා, අංක 56/13, තුම්බෝවිල, පිළියන්දල | මුතුමුණි තුෂාරි ප්‍රියංකා ද සිල්වා මිය, අංක 171, දුම්රියපල අසල, නාපේ, කොස්ගොඩ |
| (09) 41747 | ලොකු විජයසිංහලාගේ සුමනාවතී මිය, කෝප්‍රල් ජයදේව මාවත, පාසැල් පෙදෙස, මංඩාවල | එදිරිසිංහ පතිරණගේ අජිත් කුමාර මයා, අංක 217 ඊ, අක්කර නමය පාර, මංඩාවල |
| (10) 41757 | රණතුංග ආරච්චිගේ ඉඳුනිල් චන්දන මයා, අංක 19, ශ්‍රී ධර්මපාල පාර, ගල්කිස්ස | පැස්කුවල් හැන්නැදිගේ රාණි වෛද්‍යතිලක මිය, අංක 21/1, ශ්‍රී ධර්මපාල මාවාත, ගල්කිස්ස |
| (11) 41761 | තල්පෙ හේවගේ ශ්‍රියාලතා මිය, පල්ලියපිටිය, රත්ගම | මේරි නෙලුම්කා ජයලත් මිය, පල්ලියපිටිය, රත්ගම |

12-110

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ඩී එෆ් සී සී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව වෙනුවෙන් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වසන්ත ගුණවර්ධන විසින් සහතික කරන ලද 2004 ජනවාරි මස 19 වැනි දින අංක 3125 දරන උකස් බැඳුම්කරය මත සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ෆෙලිසියන් පෙරේරා විසින් සහතික කරන ලද 2006 ජූලි මස 28 වැනි දින අංක 1035 දරන උකස් බැඳුම්කරය මත ඩීඑෆ්සීසී බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම, ගලේවෙල සහ ත්‍රිකුණාමලයේ පිහිටි "පී. එන්. කේ. විමලසූරිය සහ සහෝදරයෝ " යන නාමය, අභිධානය සහ ව්‍යාපාරික නාමය යටතේ ස්වකීය ව්‍යාපාරික කටයුතු කරගෙන යනු ලබන ගලේවෙල සහ ත්‍රිකුණාමලයේ පදිංචි පිංචාබඳු නිශාන්ත කුමාර විමලසූරිය යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 ජූලි මස 31 වැනි දිනට ඉහත කී පිංචාබඳු නිශ්ශංක කුමාර විමලසූරිය යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුව වෙත රුපියල් මිලියන තුනයි පන්ලක්ෂ දාහත් දහස් හත්සිය හතලිස් තුනයි ශත හැත්තෑවක් වූ (රු. 35,17,743.70) මුදලක් 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් මිලියන හාරලක්ෂ නව දහස් තුන්සිය දහසයක් වූ (රු. 14,09,316) වූ මුදලක් සඳහා වර්ෂයකට උපරිම වශයෙන් සියයට විසිදෙකක (22%) සහ අවම වශයෙන් වර්ෂයකට සියයට පහළොවක (15%) පොළී අනුපාතිකයට යටත්වන්නා වූ එක් එක් වර්ෂයේ මාස තුනකට වරක් එනම්, ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල පළමු ව්‍යාපාරික දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොලහක කාලයන් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතයි හතක (7%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම 0.5%ට තීන්දු කරන අනුපාතය මත පොළිය ද,

රුපියල් එක් මිලියන දෙලක්ෂ හතලිස් නව දහස් නවසිය අනූවක් වූ (රු. 12,49,990) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම මාස තුනකට වරක් එනම්, ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල පළමු ව්‍යාපාරික දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොලහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක (7%) ඉහළ අනුපාතිකයක් වන 0.5%ට තීන්දු කරනු ලබන අනුපාතය මත පොළිය ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත ඩීඑෆ්සීසී බැංකුව වෙත අයවිය යුතු රුපියල් මිලියන තුනයි පන්ලක්ෂ දාහත් දහස් හත්සිය හතලිස් තුනයි ශත හැත්තෑවක් වූ (රු. 35,17,743.70) මුදලක් සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් මිලියන හාරලක්ෂ නව දහස් තුන්සිය දහසයක් වූ (රු. 14,09,316) මුදලක් සඳහා

වර්ෂයකට උපරිම වශයෙන් සියයට විසිදෙකක (22%) සහ අවම වශයෙන් වර්ෂයකට සියයට පහළොවක (15%) පොළී අනුපාතිකයකට යටත් වන්නා වූ එක් එක් වර්ෂයේ සෑම මාස තුනකට වරක් එනම්, ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල පළමු ව්‍යාපාරික දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොලහක කාලයන් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතයි හතක (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරනු ලබන අනුපාතය මත පොළිය ද,

රුපියල් එක් මිලියන දෙලක්ෂ හතලිස් නවදහස් නවසිය අනූවක් වූ (රු. 12,49,990) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම මාස තුනකට එනම්, ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල පළමු ව්‍යාපාරික දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොලහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක (7%) ඉහළ අනුපාතිකයක් වන 0.5%ට තීන්දු කරන අනුපාතය මත පොළිය ද, විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර ඉහත කී උකස් බැඳුම්කරවල නියමයන්ට අනුව ඩීඑෆ්සීසී බැංකුව විසින් වැය කර ඇති මුදල් සහ දරන ලද සියලු වියදම් සහ ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3125 සහ 1035 දරන උකස් බැඳුම්කර මගින් පිංචාබදු නිශාන්ත කුමාර විමලසූරිය යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත සවිස්තර ලෙස විස්තර කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර වන ෂොක්මන් සහ සමරවික්‍රම යන මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ සංශෝධිත 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### අංක 3125 සහ 1035 දරන උකස් බැඳුම්කර මගින් බැංකුව උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කන්දපල්ල කෝරළේ, ගලේවෙල, පුවක්පිටිය පිහිටා ඇත්තාවූ ද, ගල්වංගෙඩිහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එල්. සිරිපාල විසින් සාදන ලද 1998.12.09 වැනි දින අංක 252 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : ඩී. මැණිකේ විසින් භුක්ති විඳිනු ලබන එකී අංක 252 දරන පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : ඩී. මැණිකේ විසින් භුක්ති විඳින ලබන එකී අංක 252 දරන පිඹුරේ ලොට් අංක 1 ද, දකුණට : ගලපිට වැව යනුවෙන් හැඳින්වෙන ලබන විල ද, බටහිරට : කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ මාර්ගය සහ ගලපිට වැව ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද, මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් රූඩ් දෙකක් වූ (අ. 0, රූ. 2, පර්. 0) බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත වූ සියලු දේද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

12-99/1

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටියි.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව වෙනුවෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2006 ජුනි මස 14 වැනි දින අංක 23955 සහ 23956 දරන උකස් බැඳුම්කර මත ඩීඑෆ්සීසී බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම, "දිසානායක මල්ටි ට්‍රේඩර්ස් " යන නාමය, අභිධානය සහ ව්‍යාපාරික නාමය යටතේ ස්වකීය ව්‍යාපාරික කටයුතු කරගෙන යනු ලබන ගම්පහ පදිංචි නිහාල් දිසානායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 ජූලි මස 31 වැනි දිනට ඉහත කී නිහාල් දිසානායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හයලක්ෂ දොලොස් දහස් නවසිය හැත්තෑවයි ශත හතලිස් පහක් වූ (රු. 6,12,970.45) මුදලක් සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ හැටහය දහස් හයසිය පනස් හයක් වූ (රු. 4,66,656) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක (7%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී නිහාල් දිසානායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හයලක්ෂ දොලොස් දහස් නවසිය හැත්තෑවයි ශත හතලිස් පහක් වූ (රු. 6,12,970.45) මුදලක් සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ හැටහය දහස් හයසිය පනස් හයක් වූ (රු. 4,66,656) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයකට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හත (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තින්දු කරන අනුපාතිකයක් මත පොළිය ද විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු ද අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර ඉහත කී අංක 23955 සහ 23956 දරන උකස් බැඳුම්කර මගින් නිහාල් දිසානායක යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කරන ලද මෙහි සවිස්තර ලෙස විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම යන මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ සංශෝධිත 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**අංක 23955 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ඔරුතොට ගමේ පිහිටා ඇත්තා වූ ද, "අඹගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් සාදන ලද 1998.02.28 වැනි දින අංක 3406 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : සාම මාවත ද, නැගෙනහිරට : නන්දන දිසානායකගේ එම ඉඩමේම ලොට් අංක "බී" කොටස ද, දකුණට : ජයන්ත ගාමිණී කුමාර යන අයගේ ඉඩම ද, බටහිරට : ලොට් අංක 3 සහ 2 ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්චස් විසිතුනක් වූ (අ. 0, රූ. 0, පර්. 23) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද වේ.

**අංක 23956 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ අස්ගිරියේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද 1986.12.14 දින අංක 47A/1985 දරන පිඹුරේ "දෙල්ගහලන්ද වත්ත" ඉඩමේ ලොට් අංක "13B" ලෙස නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 13A ද, නැගෙනහිරට : ලොට් අංක 26 ද (මාර්ගය සඳහා වෙන් කිරීම), දකුණට : ලොට් අංක 12 ද, බටහිරට : එම ඉඩමේම කොටසක් ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 15.5) වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේද අංක 47/85 දරන පිඹුරේ ලොට් අංක 26 ලෙස නිශ්චිතව දක්වා ඇති මාර්ග අයිතිය ද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

12-98/2

---

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මතකරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙනුවෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2006 ජුනි මස 14 වැනි දින අංක 23957, වර්ෂ 2006 සැප්තැම්බර් මස 27 වැනි දින අංක 24270 සහ 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 25843 දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම "දිසානායක මල්ටි ට්‍රේඩර්ස් " යන නාමය, අභිධානය සහ ව්‍යාපාරික නාමය යටතේ ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන ගම්පහ පදිංචි නිහාල් දිසානායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 ජුනි මස 30 වැනි දිනට එකී නිහාල් දිසානායක යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත රුපියල් මිලියන දෙකයි හයලක්ෂ පනස්තුන් දහස් නවසිය පනස් නවයයි ශත තිස්හතරක් වූ (රු. 26,53,959.34) මුදලක් සහ 2010 ජූලි මස 01 වැනි දින සිට සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් මිලියන නවලක්ෂ හත්දහස් විසි අටයි ශත අසූ හතක් (රු. 19,07,028.87) වූ මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිසංශෝධනය කරනු ලබන සති දෙළහක කාලයක් සඳහා බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට දොළහයි දශම පහක (12.5%) ඉහල අනුපාතිකයක් මත පොළිය ද, 2010 ජුනි මස 30 වැනි දිනට හිඟව පවත්නා රුපියල් මිලියන එකයි හයලක්ෂ තිස්හතර දහස් පන්සිය හතලිස් හයයි ශත හැටපහක් (රු. 16,34,546.65) වූ බැංකු අයිරා මුදලක් ද ඒ සඳහා 2010 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට විසිහයක (26%) පොළී මුදලක් ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් මිලියන දෙකයි හයලක්ෂ පනස් තුන් දහස් නවසිය පනස් නවයයි ශත තිස් හතරක (රු. 26,53,959.34) මුදල සහ 2010 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් මිලියන නවලක්ෂ හත්දහස් විසිඅටයි ශත අසූ හතක් වූ (රු. 19,07,028.87) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිසංශෝධනය කරනු ලබන සති දෙළහක කාලයක් සඳහා බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට දොළහයි දශම පහක (12.5%) ඉහල අනුපාතිකයක් මත පොළිය ද, 2010 ජූලි මස 30 වැනි දිනට හිඟව පවත්නා රුපියල් මිලියන එකයි හයලක්ෂ තිස්හතර දහස් පන්සිය හතලිස් හයයි ශත හැටපහක් වූ (රු. 16,34,546.65) බැංකු අයිරා මුදලක් ද ඒ සඳහා 2010 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට විසිහයක (26%) පොළී මුදල හෝ විකිණීමේ දිනයට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 23957, 24270 සහ 25843 දරන උකස් බැඳුම්කරවල නියමයන්ට අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් වැයකර ඇති මුදල් සහ දරන ලද සියලු වියදම් සහ ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23957, 24270 සහ 25843 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී නිහාල් දිසානායක විසින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත සවිස්තරව ලෙස විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම යන මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**අංක 23957, 24270 සහ 25843 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, අස්ගිරියේ පිහිටා ඇත්තාවූ ද බලයලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද 1986.12.14 වැනි දින අංක 47A/1985 දරන පිඹුරේ "දෙල්ගහලන්දවත්ත" නමැති ඉඩමේ ලොට් 13බී ලෙස ලකුණුකර ඇත්තා වූ ද, උතුරට : ලොට් 13 "ඒ " ද, නැගෙනහිරට : ලොට් අංක 26 ද (මාර්ගය සඳහා වෙන් කරන ලද කොටස) දකුණට : ලොට් අංක 12 ද, බටහිරට : එම ඉඩමේම කොටසක් ද, යන මායිම් තුළ පිහිටියාවූ ද ප්‍රමාණයෙන් පර්චස් පහලොවයි දශම පහක් (අ. 0. රූ. 0, පර්. 15.5) වූ ද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, වගාවන් සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද සහ අංක 47/85 දරන පිඹුරේ ලොට් අංක 26 ලෙස නිශ්චිතව දක්වා ඇති මාර්ගයක් වශයෙන් භාවිතා කිරීමේ අයිතිය ඇති ඉඩම් කොටස ද වේ.

ලොට් අංක "13බී" ලෙස ලකුණු කරන ලද ඉහත කී ඉඩම පහත දැක්වෙන පරිදි නැවත මැන ඇත :

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, අස්ගිරිය ගමේ පිහිටා ඇත්තා වූ ද වරිපනම් අංක 34/2 මල්වත්ත පාර දරන සහ "දෙල්ගහලන්දවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන්නාවූ ද බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් සාදන ලද 2003.10.07 දින අංක 3917 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර ඇත්තා වූ ද උතුරට : නීල් ජයරත්න යන අයගේ එම ඉඩමේම ලොට් අංක 13 ඒ ද, නැගෙනහිරට : මල්වත්ත පාර දෙසට ඇති මාර්ගය ද, දකුණට : විජේරත්න යන අයට අයත් එම ඉඩමේම ලොට් අංක 12 ද, බටහිරට : විජේරත්න යන අයට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්චස් පහලවයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 15.5) වූ ද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගහකොළ, වගාවන් සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02

12-97

---

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. එන්. සී. ජයකොඩි විසින් සහතික කරන ලද 2008.02.19 වැනි දින අංක 510 දරන උකස් බැඳුම්කරය මත ද 2008.09.25 වැනි දින අංක 589 දරන උකස් බැඳුම්කරය මත ද 2009.04.02 දින අංක 690 දරන උකස් බැඳුම්කරය මත ද සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම "එක්ස්ඕඩස් ටුවරින් ඇන් ලිමිටඩ්" යන නාමය, අභිධානය සහ ව්‍යාපාරික නාමය යටතේ ස්වකීය හවුල් ව්‍යාපාරය කරගෙන යනු ලබන කුලියාපිටියේ පදිංචි පානදුරේ ආරච්චිගේ රුවන් දේශබන්දු රූපසිංහ සහ විතාන අප්පුහාමිලාගේ දෝන චමරි රෝස් ඩිලානි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 මැයි මස 31 වැනි දින වන විට ඉහත කී පානදුරේ ආරච්චිගේ රුවන් දේශබන්දු රූපසිංහ සහ විතාන අප්පුහාමිගේ දෝන චමරි රෝස් ඩිලානි යන අයගෙන් සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව වෙත රුපියල් මිලියන දෙකයි නවලක්ෂ හාරදහස් නවසිය විස්සයි ශත හතලිස් හතරක් වූ (රු. 29,04,920.44) මුදලක් සහ 2010 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් මිලියන නවලක්ෂ අනූහය දහස් නවසිය අසූපහයි ශත හැත්තෑ දෙකක් වූ (රු. 19,96,985.72) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහයක (26%) පොළී මුදලක් ද, රුපියල් හත්ලක්ෂ හැටපන් දහසක් වූ (රු. 7,65,000) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන එක් මාසික බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට දහයක (10%) ඉහල අනුපාතියක් මත වූ පොළිය ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී පානදුරේ ආරච්චිගේ රුවන් දේශබන්දු රූපසිංහ සහ විතාන අප්පුහාමිලාගේ දෝන චමරි රෝස් ඩිලානි යන අයගෙන් සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව වෙත රුපියල් මිලියන දෙකයි නවලක්ෂ හාරදහස් නවසිය විස්සයි ශත හතලිස් හතරක් වූ (රු. 29,04,920.44) මුදලක් සහ 2010 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් මිලියන නවලක්ෂ අනූහය දහස් නවසිය අසූපහයි ශත හැත්තෑ දෙකක් වූ (රු. 19,96,985.72) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහයක (26%) පොළී මුදලක් ද, රුපියල් හත්ලක්ෂ හැටපන් දහසක් වූ (රු. 7,65,000) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට දහයක (10%) ඉහල අනුපාතිකයක් මත වූ පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම සඳහා ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර ඉහත කී අංක දරන උකස් බැඳුම්කරවල නියමයන්ට අනුව සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව විසින් වැයකර ඇති මුදල් සහ දරන ලද සියලු වියදම් සහ ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී විතාන අප්පුහාමිලාගේ දෝන චමරි රෝස් ඩිලානි විසින් ඉහත කී අංක 510 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව වෙත උකස් කරන ලද පහත සවිස්තර ලෙස විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය ද ඒ මත වූ වෙනත් සියලු දේ ද ඉහත කී පානදුරේ ආරච්චිගේ රුවන් දේශබන්දු රූපසිංහ සහ විතාන අප්පුහාමිලාගේ දෝන චමරි රෝස් ඩිලානි යන අය විසින් ඉහත කී අංක 589 සහ 690 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට වෙත උකස් කරන ලද පහත සවිස්තර ලෙස විස්තර කරන ලද දේපළ සහ පරිශ්‍රය ද ඒ මත වූ වෙනත් සියලු දේද කොළඹ බලයලත් ප්‍රසිද්ධ වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම යන මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය

අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**අංක 510 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත කටුගම්පොල හත්පත්තුවේ, දකුණු කටුගම්පොල කෝරළේ, කනදුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද ලිඳකොටුවේහේන්යාය, දවටගහමුලහේන, ලිඳකොටුවේවත්ත, මීගහමුලවත්ත සහ බුලුගහමුල වත්ත සමන්විත වන්නා වූ කනදුල්ල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද 1992 ජූලි මස 20 වැනි දින අංක 3749 දරන පිඹුරේ ලොට් අංක 53 ලෙස නිරූපනය කරන අත්තා වූ ද, එකී අංක 3749 දරන පිඹුර අනුව උතුරට : අංක 3749 දරන පිඹුරේ ලොට් අංක 52 ද, නැගෙනහිරට : අඩි විස්සක් පළල මාර්ගයක් සඳහා වෙන් කළ ඉහත කී අංක 3749 දරන පිඹුරේ ලොට් අංක "ආර් 7" ද, දකුණට : අඩි විස්සක් පළල මාර්ගයක් සඳහා වෙන් කළ ඉහත කී අංක 3749 දරන පිඹුරේ ලොට් අංක "ආර් 8" ද, බටහිරට : අංක 3749 දරන පිඹුරේ ලොට් අංක 54 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කුලියාපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම දෙකයි පහක් වූ (අ. 0, රූ. 0, පර්. 16.25) ඉහත ලොට් අංක 53 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඒ හා සම්බන්ධ වෙනත් සියලු ආශ්‍රිත දේද වේ.

වඩාත් මෑතකාලීන මැනීමකට අනුව ඉහත කී ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කරනු ලැබේ. :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත කටුගම්පොල හත්පත්තුවේ, දකුණු කටුගම්පොල කෝරළේ, කනදුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද ලිඳකොටුවේහේන්යාය, දවටගහමුලහේන, ලිඳකොටුවවත්ත, මීගහමුලවත්ත සහ බුලුගහමුල වත්ත සමන්විත වන්නාවූ කනදුල්ල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2007 ජූනි මස 24 වැනි දින අංක 5187A දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කර ඇත්තාවූ ද එකී අංක 5187A දරන පිඹුරට අනුව උතුරට : අංක 3749 දරන පිඹුරේ ලොට් අංක 52 ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බටහිරට : අංක 3749 දරන පිඹුරේ ලොට් අංක 54 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, කුලියාපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම දෙකයි පහක් වූ (අ. 0, රූ. 2, පර්. 16.25) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඒ හා සම්බන්ධිත වෙනත් සියලු දේ ද වේ.

**අංක 589 සහ 690 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත කටුගම්පොල හත්පත්තුවේ, දකුණු කටුගම්පොල කෝරළේ, කනදුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "කටුලියැද්දහේන" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා (බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2001 දෙසැම්බර් මස 28 වැනි දින අංක 2019 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලේ උප බෙදුමක් වූ) බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2004 ඔක්තෝබර් මස 02 වැනි දින අංක 2019 දරන පිඹුරේ ලොට් අංක "2C" ලෙස ලකුණු කර ඇත්තා වූ ද එකී අංක 2019 දරන පිඹුරට අනුව උතුරට : ඔය සඳහා වූ රක්ෂිතය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. ගුණසේකර විසින් සාදන ලද 1939.01.16 වැනි දින අංක 2001 දරන පිඹුරේ ලොට් අංක "F" සහ ලොට් අංක "2B" ද, දකුණට : කුලියාපිටිය සිට මාදම්පෙ දෙසට වූ ප්‍රධාන මාර්ගය ලොට් අංක 3, ලොට් අංක 2A සහ 2B ද, බටහිරට : එම පිඹුරේම ලොට් අංක 1 සහ ලොට් අංක 2A ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් පර්චස් තිස්නවයක් වූ (අ. 0, රූ. 0, පර්. 39) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ.

ලොට් අංක 2C දරන ඉහත කී ඉඩම් කොටස පහත දැක්වෙන ඉඩමෙන් බෙදා වෙන් කරන නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත කටුගම්පොල හත්පත්තුවේ, දකුණු කටුගම්පොල කෝරළේ, කනදුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කටුලියැද්දහේන" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2001 දෙසැම්බර් මස 28 වැනි දින අංක 2019 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණුකර ඇත්තාවූ ද උතුරට හා නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. ගුණසේකර විසින් සාදන ලද 1939.01.16 වැනි දින අංක 2001 දරන පිඹුරේ ලෙට් අංක "F "ද, දකුණට : කුලියාපිටිය සිට මාදම්පේ දෙසට වූ ප්‍රධාන මාර්ගය සහ අංක 2019 දරන පිඹුරේ ලොට් අංක 3 ද, බටහිරට : අංක 2019 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 3 ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් වූ (අ. 0, රූ. 1, පර්. 20) බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල සහ ඒ මත වූ සියලු වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

12-95

---

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අතුල වලිසුන්දර විසින් ලියා සහතික කරන ලද අංක 5028 හා 2009 මාර්තු මස 20 සහ 5203 හා 2009 සැප්තැම්බර් මස 16 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක

17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තාවූ ද, ලියාපදිංචි කාර්යාලය මහරගම පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) ග්ලෝබල් ජීඑස්එම් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර ඇති හෙයින් ද, 2010 ජූලි මස 31 වැනි දිනට එකී "ග්ලෝබල් ජීඑස්එම් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට ඉහත සඳහන් අංක 5028 හා 5203 දරන උකස් බැඳුම්කරය මත රුපියල් දෙකෝටි විසිහත් ලක්ෂ දෙදහස් තුන්සිය පනස් නවයකුත් ශත හැත්තෑ එකක (රු. 2,27,02,359.71) මුදලක් සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හැත්තෑහතර ලක්ෂ අනූහතර දහස් හත්සිය හැත්තෑ තුනකුත් ශත පනස් දෙකක (රු. 74,94,773.52) අයිරාව මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද, රුපියල් දහහත් ලක්ෂයක (රු. 17,00,00,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහයකුත් දශම පහ (26.5%) බැගින් පොළිය ද, රුපියල් හැත්තෑපන් ලක්ෂ හැටදහසක (රු. 75,60,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහතරකුත් දශම පහ (24.5%) බැගින් පොළිය ද, රුපියල් හතලිස් දෙලක්ෂ අසූ දහස් පන්සිය අනූ අටකුත් ශත තිස්තුනක් (රු. 42,80,598.33) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාස වල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහේ බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහළ අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දෙකෝටි විසිහත් ලක්ෂ දෙදහස් තුන්සිය පනස් නවයකුත් ශත හැත්තෑ එකක (රු. 2,27,02,359.71) මුදල සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, රුපියල් හැත්තෑහතර ලක්ෂ අනූහතර දහස් හාරසිය හැත්තෑ තුනකුත් ශත පනස් දෙකක (රු. 74,94,773.52) අයිරාව මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද රුපියල් දහහත් ලක්ෂයක (රු. 17,00,000) මුදලක් සඳහා වර්ෂයට සියයට විසිහයකුත් දශම පහ (26.5%) බැගින් පොළිය ද රුපියල් හැත්තෑපන් ලක්ෂ හැටදහසක (රු. 75,60,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහතරකුත් දශම පහ (24.5%) බැගින් පොළිය ද, රුපියල් හතලිස් දෙලක්ෂ අසූ දහස් පන්සිය අනූ අටකුත් ශත තිස්තුනක් (රු. 42,80,598.33) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහේ බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහළ අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ හා ඊට හිමි මාර්ග අයිතිය ද සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5028 හා 5203 දරන උකස් බැඳුම්කරය මගින් බොරලැස්ගමුවේ අණ්ඩුවත්ත කන්කානම්ගේ ශාන්ත අමරරාජ ජයසේන විසින් සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් එකී ග්ලෝබල් ජීඑස්එම් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය එහි පිහිටි සියලු දේ සහ ඊට හිමි මාර්ග අයිතිය ද සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 5028 සහ 5203 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත වේරහැර පිහිටි ජනතා මාවත වරිපනම් අංක 306/11 දරන "දවටගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විල්මට් සිල්වා විසින් මැන සකස් කරන ලද අංක 1982 හා 2006 නොවැම්බර් මස 21 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : අඩි 15ක් පළල පාර (අංක 910625 දරන පිඹුරේ ලොට් 4A) ද, නැගෙනහිරට : අංක 3079 දරන පිඹුරේ ලොට් E ද, දකුණට : එම ඉඩමේම කොටසක් (ජනතා මාවත වරිපනම් අංක 306/6 යනාදී වූ පරිශ්‍රය) ද, බස්නාහිරට : ජනතා මාවත ද යන මායිම් ඇතුළත පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) නොහොත් හෙක්ටයාර් 0.0455ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. (මෙම ඉඩම දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත)

මෙහි ඉහතින් විස්තර කර තිබෙන ලොට් 1 දරන බිම් කට්ටිය පහත දැක්වෙන බිම් කොටස් ඒකාබද්ධ කිරීමක් වේ.

1. ඉහත කී වේරහැර පිහිටි "දවටගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ මැන සකස් කළ අංක 4203 හා 1997 දෙසැම්බර් මස 13 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් D1 ලකුණු කළ බිම් කට්ටිය වන බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : අඩි 15ක් පළල පාර ද, නැගෙනහිරට : ලොට් D2 ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : ජනතා මාවත ද යන මායිම් ඇතුළත පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) නොහොත් හෙක්ටයාර් 0.0253ක් බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස. (මෙම ඉඩම දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.)

2. ඉහත කී වේරහැර පිහිටි "දවටගහවත්ත" නමැති ඉඩමේ ඉහත සඳහන් අංක 4203 දරන පිඹුරේ දැක්වෙන ලොට් D2 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : අඩි 15ක් පළල පාර ද, නැගෙනහිරට : අංක 3079 දරන පිඹුරේ ලොට් E ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : ලොට් D1 ද යන මායිම් ඇතුළ පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 08) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස (මෙම ඉඩම දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.)

මෙයට පහත දැක්වෙන බිම් කොටස තුළින්, මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

ඉහත කී වේරහැර පිහිටි "දවටගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. වයි. අබේවර්ධන මැන සකස් කළ අංක 910625 හා අංක 1991 ජූනි මස 09 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 4A ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : අංක 856 දරන පිඹුරේ ලොට් අංක 1, 2 සහ 3 ද, නැගෙනහිරට : ලොට් 5F ද, දකුණට : ලොට් අංක 5A, 5B, 5C සහ 5E ද, බස්නාහිරට : ජනතා මාවත ද යන මායිම් ඇතුළත පර්චස් දොළහකුත් දශම පහයි එකක් (අ. 0, රූ. 0, පර්. 12.51) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස. (මෙම ඉඩම දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත)

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

12-96

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරැල්ල ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.09.09 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0820-624822-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 12 දිනැති අංක 2466 සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. ආර්. අමරසේන විසින් සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 05 වැනි දිනැති අංක 411 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙල්ගොඩ පදිංචි ගොඩකුඹුර ගමගේ සරත් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ තුන්දහස් නවසිය අසූනවයයි ශත එකක (රු. 6,03,989.01) මුදලක්, 2009 ජූලි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 6,03,989.01 මුදලද, 2009 ජූලි මස 31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 2466 සහ 411 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මීගහවත්ත සහ දරනගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 23 වැනි දිනැති අංක 692ඒ දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන කට්ටියහේන අළුබෝගහවත්ත සහ නුගගහලන්ද සහ ගල්හේන අළුබෝගහවත්ත සහ නුගගහලන්ද නමැති ඉඩමේ ලොට් 10 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී සැලැස්මේ සඳහන් ලොට් 9 ද, නැගෙනහිරට : ලොට් ආර් 1 (දැන් ආර් 01ඒ අඩි 20ක් පළල පාර) දකුණට : එකී සැලැස්මේ ලොට් 11 සහ බස්නාහිරට : එල්. ඩී. පෙරේරා සහ තවත් අයගේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 692ඒ දරන සැලැස්ම අනුව පර්චස් පහලොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 449/53 සහ සී 755/156 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 692ඒ දරන සැලැස්මේ ලොට් ආර් 1 (දැන් ලොට් ආර් 01ඒ) සහ (ලොට් ආර් 01බී) ලකුණු කල ප්‍රධාන පාරට යන පාර සඳහා වෙන් කිරීම උඩින් මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමගය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-78/2

---

**සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මතකරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටියි.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව වෙනුවෙන් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් සහතික කරන ලද 2004 සැප්තැම්බර් මස 02 වැනි දින අංක 2484 දරන උකස් බැඳුම්කරය මත සහ 2007 නොවැම්බර් මස 23 වැනි දින අංක 4335 දරන උකස් බැඳුම්කරය මත ඩීඑෆ්සීසී බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම වරකාපොල පිහිටි " දිලින මෝටර්ස් ඇන්ඩ් ට්‍රේඩර්ස් " යන නාමය, අභිධානය සහ ව්‍යාපාරික නාමය යටතේ ස්වකීය ව්‍යාපාරික කටයුතු කරගෙන යනු ලබන වරකාපොල පදිංචි කෝන්ගහ ගෙදර රත්නායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 ජූලි මස 31 වැනි දිනට ඉහත කී කෝන්ගහ ගෙදර රත්නායක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක් මිලියන හයලක්ෂ හැටපන් දහස් පන්සිය හැට දෙකයි ශත හයක් වූ (රු. 16,65,562.06) මුදලක් 2010 අගෝස්තු මස 01 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ විසිහතර දහස් දෙසිය අසූ හයයි ශත හැත්තෑ දෙකක් වූ (රු. 7,24,286.72) වූ මුදලක් මත වර්ෂයකට සියයට විසිහතරක් වූ (24%) පොළී මුදලක් ද, රුපියල් හාරලක්ෂ දහසය දහස් හයසිය හැටක් වූ (රු. 4,16,660) මුදලක් මත සෑම අවුරුද්දක ම මාස තුනෙන් තුනට එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල පළමු ව්‍යාපාරික දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන්නා වූ වර්ෂයකට සියයට දහයයි දශම පහක (10.5%) ආන්තිකයක් ද සමග ප්‍රතිශෝධිත දිනයේ දී පවත්නා පහත සඳහන් ආකාරයට පාදක වූ අනුප්‍රමාණවලින් වඩා වැඩි අනුප්‍රතිකය මත වූ ද එනම් :

* වර්ෂයකට 0.5%කට ආසන්නම ඉහළ අගයකට තීන්දුකරන ලද සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකය (ඒ. ඩබ්ලිව්. පී. ආර්) හෝ ;

* වර්ෂයකට 0.5%කට ආසන්නතම ඉහල අගයකට තීන්දු කරන ලද රඳවුම් බදු අඩුකරන ලද දින 91ක භාණ්ඩාගාර බිල්පත් ශුද්ධ අනුපාතකය, මත වූ

පොළී මුදලක් ද සමග අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් එක් මිලියන හයලක්ෂ හැටපන් දහස් පන්සිය හැට දෙකයි ශත හයක් වූ (රු. 16,65,562.06) මුදල සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා රුපියල් හත්ලක්ෂ විසිහතර දහස් දෙසීය අසූ හයයි ශත හැත්තෑ දෙකක් වූ (රු. 7,24,286.72) මුදලක් මත වර්ෂයකට සියයට විසිහතරක් වූ (24%) පොළී මුදලක් ද, රුපියල් හාරලක්ෂ දහසය දහස් හයසිය හැටක් වූ (රු. 4,16,660) මුදලක් මත සෑම අවුරුද්දක ම මාස තුනෙන් තුනට එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල පළමු ව්‍යාපාරික දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන්නා වූ වර්ෂකට සියයට දහයයි දශම පහක (10.5%) ආන්තිකයක් ද සමග ප්‍රතිශෝධිත දිනයේ දී පවත්නා පහත සඳහන් ආකාරයට පාදක වූ අනුප්‍රමාණවලින් වඩා වැඩි අනුප්‍රතිකය මත වූ ද එනම්,

* වර්ෂයකට 0.5%කට ආසන්නම ඉහළ අගයකට සකස්කරන ලද සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකය (ඒ. ඩබ්ලිව්. පී. ආර්) හෝ ;

* වර්ෂයකට 0.5%කට ආසන්නතම ඉහල අගයකට තීන්දු කරන ලද රඳවුම් බදු අඩුකරන ලද දින 91ක භාණ්ඩාගාර බිල්පත් ශුද්ධ අනුපාතකය, මත වූ ;

පොළී මුදලක් හෝ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරි වූ එහි යම් මුදලක් වේ නම් එම ඉතිරි මුදල ද, බැංකුව වෙත උකස් කරන ලද ඉඩම සහ පරිශ්‍රය සහ එහි වූ වෙනත් සියලු දේද සඳහා බැංකුව විසින් දරන ලද සියලු ප්‍රචාරක සහ විකුණුම් පිරිවැය ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර ඉහත කී උකස් බැඳුම්කරවල නියමයන්ට අනුව ඩීඑෆ්සීසී බැංකුව විසින් දරන ලද වෙනත් සියලු මුදල් සහ වැයකරන ලද පිරිවැය සහ ගාස්තු ද අයකර ගැනීම සඳහා ඉහත කී කෝන්ගහ ගෙදර රත්නායක යන අය විසින් ඉහත කී අංක 2484 සහ 4335 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කරන ලද පහත සවිස්තර ලෙස විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය ද ඒ මත වූ වෙනත් සියලු දේ ද මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ සංශෝධිත 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**අංක 2484 සහ 4335 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කීරවැලි පත්තුවේ, බෙලිගල් කෝරළේ, කුකුල්පනේ ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු කේ. කේ. කනගසබෙයි විසින් සාදන ලද 2001.11.04 වැනි දින අංක 904 දරන පිඹුරේ තල්ඔවිට ලොට් අංක 01 යනුවෙන් ලකුණුකර ඇත්තාවූ ද, එකී 904 දරන පිඹුරට අනුව, උතුරට : බලයලත් මිනින්දෝරු බී. පී. ගංගොඩවිල විසින් සාදන ලද අංක 2013 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස නිරූපනය කරන ලද ඩබ්. සුබතේරිස් විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, නැගෙනහිරට : වරකාපොල අඟුරුවැල්ල ප්‍රධාන මාර්ගය ද, දකුණට : ඉහත කී අංක 904 දරන පිඹුරේ ලොට් අංක 02 ද, බටහිරට : සුසානභූමිය ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් විසිහතරයි දශම හතක් වූ (අ. 0, රූ. 0, පර්. 24.7) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

12-99/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - දෙහිවල ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.03 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0140-771872-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. කේ. විජේරත්න විසින් සහතික කරන ලද 2007 ජූලි මස 12 දිනැති අංක 1463 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙහිවල පදිංචි අබ්දුල් අසීස් මොහමඩ් ෂිඩ්නි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි හැත්තෑහයලක්ෂ අසූතුන්දහස් එකසිය එකොළහයි ශත පහළොවක (රු. 2,76,83,111.15) මුදලක්, 2008 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 2,76,83,111.15 මුදලද, 2008 නොවැම්බර් මස 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 1463 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්වල වෝඩ් අංක 7 පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලයුදීන් විසින් සාදන ලද 1990 දෙසැම්බර් මස 14 වැනි දිනැති අංක 2015බී දරන මිණුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොරකගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ3 ලකුණු කළ වරිපනම් අංක 46බී දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ගරු කොටගම වාචිස්සර මාවත ද, නැගෙනහිරට : ලොට් ඒ4 ද, දකුණට : පින්වත්ත පාර වරිපනම් අංක 3/1 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : ලොට් ඒ2 ද යන මායිම් තුළ එකී අංක 2015බී දරන සැලැස්ම අනුව පර්චස් එකොළහයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 11.80) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1707/233 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-77/1

---

### සෙලාන් බැංකුව පීඑල්සී - වැලිමඩ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.09.09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0570-01838403-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සුහයිරා ෆිලික් විසින් දෙකම සහතික කරන ලද 2006 අගෝස්තු මස 22 දිනැති අංක 523 සහ 2006 ඔක්තෝබර් මස 12 වැනි දිනැති අංක 673 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම වැලිමඩ, ජයසේකර මුදියන්සේලාගේ ආනන්ද කුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ හතලිස්එක්දහස් හැත්තෑ හතයි ශත හැත්තෑදෙකක (රු. 8,41,077.72) මුදලක්, 2009 නොවැම්බර් මස 27 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 8,41,077.72 මුදලද, 2008 නොවැම්බර් මස 28 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 523 සහ 673 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දඹවිනි පළාත කෝරළේ, දඹවින්න ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් සාදන ලද 2006.04.24 දිනැති අංක 5966 දරන සැලැස්මේ ලොට් 1 ලෙස පෙන්නුම් කරනු ලබන අම්පිටියෙගොඩවත්ත හෙවත් කොස්ගහකුඹුරෙවත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටස් සහ පාර ද, දකුණට : පාර සහ ප්‍රවේශ මාර්ගය සහ බස්නාහිරට : ප්‍රවේශ මාර්ගය සහ මෙම ඉඩමේ කොටසක් ද යන මායිම් තුළ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 610/185 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-78/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 01/503/02/176/පීඕ1/52, 01/500/02/691/එක්ස්2/765.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. කේ. ලොකුගේ සහ එස්. වී. පී. කුරේ විසින් සහතික කරන ලද 2007.08.27 සහ 2008.03.31 දින හා අංක 700 සහ 1302 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කුරුණෑගල පදිංචි වර්ණකුලසූරිය ආරච්චිගේ දෝන දීපා ගයාත්‍රි රණසිංහ සහ ලසන්ත සංජීව රණසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.07.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස්ලක්ෂ හැටතුන් දහස් තුන්සිය පනස් අටයි ශත අසූ දෙක (රු. 30,63,358.82)ක සහ රුපියල් පන්ලක්ෂ අනූහත් දහස් හයසිය විසි එකයි ශත දොළහ (රු. 5,97,621.12) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 700 සහ 1302 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එක්දහස් හයසිය හැත්තෑ අටයි ශත පනස් පහ (රු. 1,678.55)ක් සහ රුපියල් තුන්සිය හැත්තෑහයයි ශත

පනස් අට (රු. 376.58) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, දෙවන මහල, අංක 53හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ. අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභාවේ, බටගම උතුර ග්‍රාමයේ පිහිටි ජා-ඇල ගනේමුල්ල පාරේ වරිපනම් අංක 226 පිහිටි ඉල්ලුක්කැල්ල හෙවත් පුවක්වත්තකැල්ල නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. නන්දසේන විසින් සකසන ලද 2007.07.21 දිනැති හා අංක 2648 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 648/181 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද එකී අංක එච්/798 පිඹුරේ කැබලි අංක 29 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-80/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : කේ4/4463/කේවයි3/782, කේ4/7773/කේවයි4/596.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. ඊරියගම සහ ඒ. එන්. ඕපාත විසින් සහතික කරන ලද 2002.02.01 දින සහ 2007.11.26 දින හා අංක 392 සහ 621 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, හන්දෙස්ස පදිංචි සංසරාජගේ චන්ද්‍රන දිසානායක සහ ජයවර්ධන ගෙදර දිලානි චන්ද්‍රලතා ජයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.07.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ විසිදෙදහස් හැත්තෑ හයයි ශත පනස් දෙක (රු. 2,22,076.52)ක සහ රුපියල් හයලක්ෂ අනූහතර දහස් තුන්සිය අසූහතයි ශත පනස් හය (රු. 6,94,387.56) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 392 සහ 621 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසි එකයි ශත හැට නවය (රු. 121.69)ක් සහ රුපියල් තුන්සිය අසූවයි ශත හතලිස් නවය (රු. 380.49) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවියට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ පළාත, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ, හන්දෙස්ස පිහිටි පිටකොටුවෙහේන නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. එම්. ජී. මුණසිංහ විසින් සකසන ලද 1998.03.22 වැනි දිනැති හා අංක 1955 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 18ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 356/64 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-80/2

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : එස්-7/75121/ඩී7/531, එස්-7/76119/එස්ඕ2/041.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. ජයවර්ධන විසින් සහතික කරන ලද 2004.05.24 දින සහ 2005.12.08 දින හා අංක 483 සහ 591

දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පල්ලෙබැද්ද පදිංචි ඌරලගමගේ ධර්මප්‍රිය හෙවත් ඌරලගමගේ ධර්මසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ පනස් දහස් හාරසිය අසූ අටයි ශත හැට දෙක (රු. 4,50,488.62)ක සහ රුපියල් තුන්ලක්ෂ නමදහස් තුන්සිය එකයි ශත අසූහය (රු. 3,09,301.86) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 483 සහ 591 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අනූ හතරයි ශත තිස් නවය (රු. 194.39)ක් සහ රුපියල් හැත්තෑ දෙකයි ශත පනස් පහ (රු. 72.55) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මහනුවර, හීරැස්සගල, බෝවලවත්ත පාර, මවුන්ට් ප්ලසන්ට් ගාඩ්න්ස්, අංක 432/1හි බලයලත් වෙන්දේසිකාර ජේ. ඩබ්. ජයසූරිය මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, තඹගම්පත්තුවේ, අටකලන්පන්න ප්‍රාදේශීය සභාවේ, ගොඩකවෙල උප කාර්යාල සීමාව තුළ බලවින්න ග්‍රාමයේ පිහිටි කටුපිලහඩුවවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. එස්. ශාන්ත විසින් සකසන ලද 2000.09.14 දිනැති හා අංක 1497 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 20ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 199/288 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-80/3

---

### මහජන බැංකුව - කිරුළපන ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2006.11.14 වැනි දිනැති අංක 3891 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මලවි ආරච්චිගේ රත්නසිරි යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී අංක 3891 දරන උකස්කරය යටතේ දැනට රුපියල් දහනව ලක්ෂ දාහතරදහස් තුන්සිය අනූදෙකයි ශත හැටනවයක (රු. 19,14,392.69) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල සහ එකී රුපියල් දහනව ලක්ෂ දාහතරදහස් තුන්සිය අනූදෙකයි ශත හැටනවයක (රු. 19,14,392.69) මුදල සඳහා 2009.04.01 වැනි දින සිට වර්ෂයකට 18.5% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා මහත්මිය විසින් 2006.11.14 වැනි දින සහතික කළ අංක 3891 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුවේ, මොරටුව නගර සභා සීමාව තුළ මෝල්පේ යන ගම පිහිටි වලකඩයාවත්ත එක්කෝ මිල්ලගහවත්ත කියන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. ආර්. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 1157 සහ 1994.09.11 වැනි දින මැන සාදන ලද පිඹුරේ ලොට් 1ඒ දරන කොටසට මායිම්, උතුරට : එම්. රොබට් ජෝශප් හිමිකම් කියන ද සොයිසා පාරේ වරිපනම් අංක 537/6 දරන දේපළ ද, නැගෙනහිරට : අංක 28 දරන ප්ලෑනයේ අංක 2 දරන කට්ටිය සහ අඩි 12ක් පළල පාර ද, දකුණට : ඊ. නිහාල් ප්‍රනාන්දු හිමිකම් කියන වලකඩයාවත්ත හෙවත් මිල්ලගහවත්ත ද, බස්නාහිරට : බී. ආර්. ඩී. මෙන්දිස් හිමිකම් කියන වරිපනම් අංක 84/12 දරන දේපළ ද යන මායිම් තුළ වූ පර්චස් දහතුනයි දශම හතයි පහ (අ. 0. රූ. 0, පර්. 13.75) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේද සමග වේ. (මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2028/119හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී මෝල්පේ යන ගම පිහිටි වලකඩයාවත්ත එක්කෝ මිල්ලගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කළ 1බී දරන කට්ටියට ඉහත කී අංක 1175 දරන ප්ලෑනයේ ප්‍රකාර මායිම්, උතුරට : 1ඒ දරන කට්ටිය ද, නැගෙනහිරට : අඩි 12ක් පළල පාර ද, දකුණට : ඊ. නිහාල් ප්‍රනාන්දු හිමිකම් කියන වලකඩයාවත්ත හෙවත් මිල්ලගහවත්ත ද, මෙම ඉඩමේ 1සී දරන කට්ටිය ද, බස්නාහිරට : 1ඒ දරන කට්ටිය ද යන මායිම් තුළ පූ පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1.0) ක් විශාල ඉඩමේ බිමෙන් ද, (මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2028/120හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී මොල්පේ යන ගම පිහිටි වලකඩයාවත්ත එක්කෝ මිල්ලගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කළ 1සී දරන කට්ටියට ඉහත කී අංක 1175 දරන ප්ලෑනයේ ප්‍රකාර මායිම්, උතුරට : 1බී දරන කට්ටිය ද, නැගෙනහිරට : අඩි 12ක් පළල පාර ද, දකුණට : ඊ. නිහාල් ප්‍රනාන්දු හිමිකම් කියන වලකඩයාවත්ත හෙවත් මිල්ලගහවත්ත ද මෙම ඉඩමේ 1සී දරන කට්ටිය ද, බස්නාහිරට : 1සී දරන කට්ටිය ද යන මායිම් තුළ වූ පර්චස් දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 0.28) ක් විශාල ඉඩමේ බිමෙන්

ද, (මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2028/121 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

12-46

---

**මහජන බැංකුව - මැජෙස්ටික් සිටි ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.27 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න විසින් සහතික කරන ලද 2005.03.16 වැනි දින අංක 1457 දරන උකස් බැඳුම්කරය මත මහජන බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවීම, ඉලුක්පිටියේ ගෙදර සංජායනී සමරනායක විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1457 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් එක් මිලියන හතලිස් දහස් නවසිය හැත්තෑ එකයි ශත පනස් පහක් වූ (රු. 10,40,971.55) මුදලක් ඉහත කී ඉලුක්පිටියේ ගෙදර සංජායනී සමරනායක යන අයගෙන් මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

2010.06.30 වැනි දින සිට වෙන්දේසි දිනය දෙක්වා එකී රුපියල් එක් මිලියන හතලිස් දහස් නවසිය හැත්තෑ එකයි ශත පනස් පහක් වූ (රු. 10,40,971.55) මුදලක් මත වර්ෂයකට සියයට පහළොවයි දශම පහක් (15.5%) තවදුරටත් වූ පොළී මුදලක් ද සමග මහජන බැංකුව වෙත අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර (ඇත්නම්) එම ගෙවීම් අඩු කිරීමෙන් පසුව සහ විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග රුපියල් එක් මිලියන හතලිස් දහස් නවසිය හැත්තෑ එකයි ශත පනස් පහක් වූ (රු. 10,40,971.55) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1457 දරන උකස් බැඳුම්කරය මගින් මහජන බැංකුව වෙත උකස්කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, දලුගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දලුගම සහ වේවැල්දූව ග්‍රාමයේ පිහිටියාවූ ද, "තනිපොල්ගහවත්ත සහ පරන වත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1959 ජූලි මස 3 වැනි දින අංක 1560 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 1 සහ ලොට් එච් ද, නැගෙනහිරට : ලොට් අංක 03 ද, දකුණට : ඩී. එෆ්. ජේ. පෙරේරා යන අයගේ ඉඩම ද, බටහිරට : පරණවත්ත ද යන මායිම් ඇතුළත පිහිටා ඇත්තා වූ ද එකී අංක 1560 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම තුනයි හතක් වූ (අ. 0, රූ. 0, පර්. 19.37) කොළඹ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සී 505/327 යටතේ ලියාපදිංචි වී ඇත්තාවූ ද, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

තවද ඉහත කී ඉඩමට පහත සඳහන් මාර්ගය සඳහා වෙන්කළ ඉඩම හරහා සහ ඒ මතින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් සමාන අයිතිවාසිකම් ද ඇතුළත් වේ. එම ඉඩම් වනුයේ -

1. ඉහත කී දලුගම සහ වේවැල්දූව පිහිටා ඇත්තා වූ ද "තනිපොල්ගහ වත්ත සහ පරන වත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ (හුණුපිටිය අලුත්පාර දෙසට දිවෙන) ඉහත කී අංක 1560 දරන පිඹුරේ ලොට් අංක "සී " ලෙස ලකුණු කර ඇත්තා වූ, උතුරට : රජයේ ඉඩම සහ ලොට් අංක 28 සිට 30 දක්වා ඉඩම් කැබලි ද, ලොට් අංක 36 සිට 42 දක්වා වූ ඉඩම් කැබලි සහ ලොට් බී ද, නැගෙනහිරට : මාර්ගය ද, දකුණට : ලොට් අංක 5 සිට 9 දක්වා කැබලි "එෆ් " ලොට් 24 සිට 27 දක්වා කැබලි, ඒ සහ ඊ මෙන්ම ලොට් 15 සිට 19 දක්වා කැබලි ද, බටහිරට : ලොට් "එච්" ද යන මායිම් තුළ පිහිටියාවූ ද ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම හතරයි තුනක් වූ (අ. 0, රූ. 1, පර්. 23.43) සී 625/197 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ.

2. ඉහත කී දලුගම සහ වේවැල්දූව පිහිටා ඇත්තාවූ ද "තනිපොල්ගහ වත්ත සහ පරන වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ඉහත කී අංක 1560 දරන පිඹුරේ (මාර්ගයක් සඳහා වෙන් කළ කොටසක් වූ) ලොට් ඊ ලෙස ලකුණු කර ඇත්තා වූ උතුරට : ලොට් සී ද, නැගෙනහිරට : ලොට් අංක 12, 20, ඒ සහ සී ද, දකුණට : ලොට් අංක 11 ද, බටහිරට : ලොට් 21, 27 සහ එෆ් ද යන මායිම් තුළ පිහිටියා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතයි පහක් වූ (අ. 0, රූ. 0, පර්. 11.75) සී 467/221 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

3. ඉහත කී දලුගම සහ වේවැල්දූව පිහිටා ඇත්තාවූ ද, "තනිපොල්ගහ වත්ත සහ පරන වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ඉහත කී අංක 1560 දරන පිඹුරේ (මාර්ගයක් සඳහා වෙන්කළ කොටසක්වූ) ලොට් "එච්" ලෙස ලකුණු කර ඇත්තා වූ උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් සී ද, දකුණට : ලොට් 2, 3 සහ 4 ද. බටහිරට : ලොට් 1 ද යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතයි පහක් වූ (අ 0, රූ. 0, පර්. 15.75) අංක සී 495/149 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

12-44

### මහජන බැංකුව - මැජෙස්ටික් සිටි ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.28 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. ඩබ්. අමරසිංහ විසින් සහතික කරන ලද 2008.09.18 වැනි දින අංක 8248 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වන්නිආරච්චිගේ ජානක සුරංග ද කොස්තා මහතා සහ වන්නිආරච්චිගේ ජෙසෙපින් එලිසබෙත් පොන්සේකා මහතා විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 8248 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් මිලියන තුනක් (රු. 30,00,000) මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

2009.03.25 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා එකී රුපියල් මිලියන තුනක් වූ (රු. 30,00,000) වර්ෂයකට සියයට විසිතුනක (23%) මුදලක් මත තවදුරටත් වූ පොලියක් ද සමග අනනතුරුව කිසියම් මුදලක් ගෙවා ඇත්නම් එම මුදල අඩු කිරීමෙන් පසුව සහ විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග එකී රුපියල් මිලියන තුනක් වූ) (රු. 30,00,000) මුදලක් අයකර ගැනීම සඳහා 2008.09.18 වැනි දින අංක 8248 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු වන අර්වින් පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ කලුබෝවිල හෙවත් දැන් නුගේගොඩ මෙල්ඩර් පෙදෙසේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් සාදන ලද 1986.02.08 දින අංක 1628 දරන පිඹුරේ නුගේගොඩ ආනන්ද පාරේ වරිපනම් අංක 26 දරන පදිංචි නිවස ද සමග "හික්ගහවත්ත පයිරුගහවත්ත සහ පයිරුගහවත්ත පලු ඕවිට" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක සී ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක බී ද, නැගෙනහිරට : ආනන්ද පාර ද, දකුණට : ලොට් අංක ඩී ද, බටහිරට : ලොට් ඒ සහ බී ද යන මායිම් තුළ පිහිටියාවූ ද දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එම් 2566/107 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම අටයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 7.81) ඉහත කී ලොට් අංක සී නමැති බෙදා වෙන් කරන ලද ඉඩම වූ ද,

බලයලත් මිනින්දෝරු පී. ඒ. එස්. ඩී. ඩී. පෙරේරා විසින් සාදන ලද 2006.03.24 දින අංක 556 දරන මෑත කාලීන මිනින්දෝරු පිඹුරෙහි පහත දැක්වෙන ආකාරයට විස්තර කර අත්තාවූ ද එනම්-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත නුගේගොඩ මෙල්ඩර් වීදියෙහි පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු පී. ඒ. එස්. ඩී. පෙරේරා විසින් සාදන ලද 2006.03.07 වැනි දින දරන අංක 556 දරන පිඹුරේ නුගේගොඩ, ආනන්ද මාවතේ වරිපනම් අංක 26 දරන පදිංචි නිවස ද, සමග "හික්ගහවත්ත පයිරුගහවත්ත සහ පයිරුගහවත්ත පලු ඕවිට" යනුයෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක එක්ස් ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වාගේ අංක 1628 දරන පිඹුරේ ලොට් අංක බී ද, නැගෙනහිරට : ආනන්ද මාවත ද, දකුණට : අංක 1628 දරන පිඹුරේ ලොට් අංක බී ද, බටහිරට : අංක 1628 දරන පිඹුරේ ලොට් ඒ සහ බී ද යන මායිම් තුළ පිහිටියාවූ ද, දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එම් 2566/107 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම අටයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 7.81) ඉහත කී ලොට් අංක එක්ස් නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

12-45

---

### මහජන බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. ජී. ජයසූරිය විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.04.23 දිනැති අංක 499 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නුගේගොඩ, ගංගොඩවිල, සෝරත මාවතේ, රබර්වත්ත පාරේ අංක 36/2 දරන ස්ථානයෙහි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන්නාවූ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන සීමාසහිත ලිතාකා ස්ටේෂණරීස් (පෞද්ගලික) සමාගම සහ විජේසුන්දර මුදියන්සේලාගේ ඉඳුනිල් සුජීව යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී අංක 499 දරන උකස්කරය මත රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හත්සිය පනහයි ශත පනස්පහක (රු. 4,63,750.55) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද,

2009.04.24 වැනි දින සිට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හත්සිය පනහයි ශත පනස්පහක (රු. 4,63,750.55) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් හත්සිය පනහයි ශත පනස් පහක (රු. 4,63,750.55) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී 2007.04.23 දිනැති අංක 499 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු

යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇතිබ බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව ගමේ වත්තේගෙදර පාරේ පිහිටා ඇති වරිපනම් අංක 255/7 දරන පෙළෙන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් 1998 ජනවාරි මස 20 වැනි දින මැන සාදන ලද අංක 546 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 9" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 546 දරන එකී පිඹුරේ ලොට් 8 ද, නැගෙනහිරට : ලොට් 15 (අඩි 15 පළල පාර) ද, දකුණට : අංක 546 දරන එකී පිඹුරේ ලොට් 10 සහ බටහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 1997 ජූලි මස 02 වැනි දින මැන සාදන ලද අංක 2076B දරන පිඹුරේ ලොට් 1A2 යන මෙකී මායිම් තුළ පිහිටි, එකී අංක 546 දරන පිඹුරට අනුව පර්චස් අටයි දශම දෙකයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 8.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ආදී සියලු දේද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2820/41 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කොටස මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී බොරලැස්ගමුව ගමේ වත්තේගෙදර පාරේ පිහිටා ඇති "පෙළෙන්ගහවත්ත" නමැති ඉඩමේ ඉහත කී අංක 456 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 15" (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කර ඇත) දරන කොටසට මායිම්, උතුරට : වත්තේගෙදර පාර සහ එකී අංක 546 දරන පිඹුරේ මෙම ඉඩමේ ලොට් 6 ද, නැගෙනහිරට : ලොට් 4, 5. 14, 2 සහ එකී අංක 546 දරන පිඹුරේ මෙම ඉඩමේ ලොට් 6 ද, දකුණට : අංක 456 දරන එකී පිඹුරේ මෙම ඉඩමේ ලොට් 13, 12, 11 සහ 10 සහ බටහිරට : අංක 546 දරන එකී පිඹුරේ මෙම ඉඩමේ ලොට් 9, 8, 7, 1, 6 සහ 3 ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 546 දරන පිඹුර අනුව පර්චස් විස්සයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.50) හෝ (හෙක්ටයාර් 0.0519) විශාල ඉඩම මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2609/249 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය
(බස්නාහිර කලාපය - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

12-47

---

### මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

නුවරඑළියේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. ඩී. නානායක්කාර විසින් සහතික කරන ලද අංක 2457 සහ 2006.10.25 දින දරන උකස්කරය හා නුවරඑළියේ ප්‍රසිද්ධ නොතාරිස් ජයමිණි අඹගහවත්ත විසින් සහතික කරන ලද අංක 685 හා 2007.10.16 දින දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම, රාතම ගෙදර රත්නායක මුදියන්සේලාගේ අබේකෝන් රත්නායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට පිළිවෙලින් රුපියල් මිලියන එකකුත් තුන් ලක්ෂ හතලිස් දහසක් (රු. 13,40,000) සහ රුපියල් දෙලක්ෂ පනස් හතර දහස් හයසිය තුනකුත් ශත හතලිස් එකක (රු. 2,54,603.41) මුදලක් දැනට අයවිය යුතු බැවින් ද, පිළිවෙලින් 2008.11.25 වැනි දින සිට වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් රුපියල් මිලියන එකකුත් තුන්ලක්ෂ හතලිස් දහසක් (රු. 13,40,000) මුදලක් හා 2009.08.27 වැනි දින සිට වර්ෂයටක සියයට විසිහය (26%) බැගින් රුපියල් දෙලක්ෂ පනස්හතර දහස් හයසිය තුනකුත් ශත හතලිස් එකක (රු. 2,54,603.41) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් මිලියන එකකුත් තුන්ලක්ෂ හතලිස්දහසක් (රු. 13,40,000)සහ රුපියල් දෙලක්ෂ පනස් හතර දහස් හයසිය තුනකුත් ශත හතලිස් එකක (රු. 2,54,603.41) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ 5, හැව්ලොක් පාරේ අංක 250හි බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2457 හා 685 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ හා කොට්ඨාසයේ, නුවරඑළිය නගර සභා සීමාව තුළ වරිපනම් අංක 45 (මීන් පෙර වරිපනම් අංක 116) දරන ලද කැලෑගල්ලේ ග්‍රාමයේ පිහිටි "ලෝවර් ගිබ්සන් ලැන්ඩ්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 10690 හා 1992.06.27 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 01 වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන් කළ හා නිරූපිත ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ඩී. ඒ. සමරසිංහගේ දේපළ ද, නැගෙනහිරට : කැබලි අංක 03 ද, වඩාත් නිවැරදිව කැබලි අංක 2 හා 3 ද, දකුණට : ලෝවර් ගිබ්සන් පාර ද, බටහිරට : එස්. එච්. ප්‍රනාන්දුට අයිති දේපළ ද යන මායිම් තුළ පිහිටි වපසරිය පර්චස් හතයි දශම බින්දුවයි තුනයි (අ. 0, රූ. 0, පර්. 7.03) හෝ හෙක්ටයාර් 0.0185 වඩාත් නිවැරදිව පර්චස් හතයි දශම තුනයි (පර්. 7.3) වන භූමිය සමග ඒ මත පිහිටි සෑම සියළු දේත් වන අතර. නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A35/217 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 40, උද්‍යාන පාර,
නුවරඑළිය.

12-48

**සෙලාන් බැංකුව පීඑල්සී - කුඩා සහ මධ්‍යම පරිමාන ව්‍යවසායකත්ව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010 සැප්තැම්බර් මස 29 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0014-02238114-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. තෙපුලන්ගොඩ විසින් සහතික කරන ලද 2006 අගෝස්තු මස 31 දිනැති අංක 949 දරන බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් 15 දිනැති අංක 1329 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, රාගම, වැලිසර, මීගමුව පාර අංක 310හි මෙසස් වාසනා ට්‍රේඩිං ලංකා (පීවීටී) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හත්කෝටි පනස්දෙලක්‍ෂ පන්දහස් දෙසිය අටයි ශත පනස්අටක (රු. 7,52,05,208.58) මුදලක්, 2010 පෙබරවාරි මස 16 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුය සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 7,52,05,208.58 මුදල ද, 2010 පෙබරවාරි මස 17 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 949 සහ 1329 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි සහ දෙවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ කඳාන උපකාර්යාලය තුල නාගොඩ පිහිටි තොටගාවා කුඹුර හෙවත් තොටුපොල කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග කුඹුරට මායිම්, උතුරට : අලගියදුර ලවාරිස් ප්‍රනාන්දුගේ කුඹුරේ මායිම් වේල්ල ද, නැගෙනහිරට : මියගිය සාම නිලධාරී හිද්දාදුර කෝර්නේලිස් මැන්දිස්ගේ උරුමක්කරුවන්ගේ සහ තවත් අයගේ ඉඩම් වෙන් කෙරෙන අගල ද, දකුණට : ඇල සහ බස්නාහිරටඃ ඇල යන මායිම් තුළ වී බෙර දහඅටක පමණ වපසරිය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 143/123හි ලියාපදිංචි කර ඇත.

එකී වී බෙර දහඅටක් පමණ වන වපසරිය ඇති කුඹුර අංක 4003 දරන සැලැස්ම අනුව පසුව මැනීමක දී පහත සඳහන් පරිදි විස්තර කර සහ මායිම් කර ඇත :

පෙර කී නාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2005 ජුනි 21 දිනැති අංක 4003 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන තොටගාවා කුඹුර හෙවත් තොටුපොල කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග මොරවත්ත පාර වරිපනම් අංක 158/2 දරන කුඹුරේ ලොට් එක්ස් ලකුණු කළ ඉඩම් කොටසට මායිම් උතුරට : මියගිය අදිරියන් ප්‍රනාන්දුගේ කුඹුර ද, නැගෙනහිරට : පිට ඇල (අඩි 6ක් පළල) ද, දකුණට : පිට ඇල (අඩි 6ක් පළල) සහ ඇල සහ බස්නාහිරට : මහාමාර්ග දිගේ වෙන්කිරීම (මැද සිට අඩි 150ක්) යන මායිම් තුළ එකී අංක 4003 දරන සැලැස්ම අනුව අක්කර හතරයි, රූඩ් එකයි, පර්චස් තිස් අටයි දශම පහයි බිංදුවක් (අ. 4, රූ. 1, පර්. 38.50) ක් විශාල ඉඩම.

ලොට් ඒ2 සහ බී2 ලකුණු කළ පාර සඳහා වෙන්කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සහ පහසුකම් සමග සහ මෙහි මින්මතු විස්තර කරනු ලබන අඩි 6ක් පළල පිට ඇල මෙහි මින් පෙර විස්තර කරන ලද එකී ලොට් එක්ස් බුක්තිවිඳීමේ අයිතිය හා සම්බන්ධ සියලු කාරණා සඳහා වෙනත් අය සමග පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය සමග.

1. පෙර කී නාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2005 පෙබරවාරි මස 08 දිනැති අංක 3645 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොරකගහවත්ත නමැති, ඉඩමේ ලොට් ඒ2 ලකුණ කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කිරීම) ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩම සහ ජෝජ් ප්‍රනාන්දුගේ සහ තවත් අයගේ කුඹුර අතර පිට ඇල ද, නැගෙනහිරට : ලොට් ඒ1 ද, දකුණට : ලොට් බී2 සහ බස්නාහිරට : කුමාරි ප්‍රනාන්දුගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 3645 දරන සැලැස්ම අනුව පර්චස් හතරක් (අ. 0, රූ. 0, පර්. 04.00) ක් විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 581/145හි ලියාපදිංචි කර ඇත.

2. පෙර කී නාගොඩ පිහිටි පෙර කී අංක 3645 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොරකගහවත්ත නමැති, ඉඩමේ ලොට් බී 2 ලකුණු කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කිරීම) ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් ඒ 2 ද, නැගෙනහිරට : ලොට් බී 1 ද, දකුණට : මොරවත්ත පාර සහ බස්නාහිරට : කුමාර් ප්‍රනාන්දුගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 3645 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 06.40)ක් විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 456/257හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 4003 දරන සැලැස්මේ නිරූපනය වන අඩි 6ක් පළල පිට ඇල වෙනත් අය සමග පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය සමග.

**දෙවැනි උපලේඛනය**

පෙර කී වැලිසර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 09 දිනැති අංක 5156 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන තලහේනවත්ත සහ කිවුල්හන්දිරම් කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඉසෙඩ් ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1685ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ, කලින් එම්. පී. පෙරේරාගේ ඉඩම සහ ඩී. පී. පෙරේරාගේ මෙම කුඹුරේ කොටස ද, නැගෙනහිරට : පිට ඇල (අඩි 10ක් පළල) ද, දකුණට : දෙපා ඇල, සීමාසහිත ඒට්කන් ස්පෙන්ස් සමාගමේ දේපළ, සීමාසහිත එන්. එස්. සමාගමේ දේපළ සහ අළුත් ඇල (අඩි 14ක්

පළල) සහ බස්නාහිරට : මීගමුව පාර, අංක 1685ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ යන මායිම් තුළ එකී අංක 5156 දරන සැලැස්ම අනුව අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විසිහයයි දශම අටයි බිංදුවක් (අ. 1, රූ. 1, පර්. 26.80) ක් විශාල ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

12-77/2

---

### කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 457157.
හොලොඹුවලගේ සරත් ප්‍රේමචන්ද්‍ර.

2010 ජූලි මස 30 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 2008 ජූනි මස 16 වැනි දින අංක 6177 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ හොලොඹුවලගේ සරත් ප්‍රේමචන්ද්‍ර බන්ධනදායී/උකස්කරු වශයෙන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ පනස්පන්දහස් නවසිය තිස් දෙකයි ශත විසි එකක (රු. 8,55,932.21) මුදලක් 2010 මැයි මස 07 වැනි දින විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ පනස්පන්දහස් නවසිය තිස් දෙකයි ශත විසි එකක (රු. 8,55,932.21) මුදල හා 2010 මැයි මස 08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,61,065.38ක මුදලක් සඳහා වාර්ෂිකව 19% බැගින් වූ පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අයකර ගැනීම සඳහා එකී අංක 6177 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තු ඕතොට කෝරළයේ, උඩපොල ගල්බඩගම ගමේ පිහිටි මොරේවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. එම්. තිලකරත්න විසින් 2007.12.02 වැනි දින අංක 7082 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 2 නමැති ඉඩමට මායිම්, එනම් උතුරට : කොළඹ පාරේ සිට පොල්ගහවෙලට දිස්වෙන පාරෙන් ද (නව කොළඹ පාර), නැගෙනහිරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද හා බස්නාහිරට : එච්. එම්. එල්. බී. හේරත්ට අයත් ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය, පර්චස් තිහයි (අ. 0, රූ. 0, පර්. 30). මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිුරුව F1815/211හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

12-132

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව වෙනුවෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2005 නොවැම්බර් මස 24 වැනි දින අංක 23320 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගම්පහ, පදිංචි ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනවිරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2010 ජූලි මස 31 වැනි දිනට ඉහත කී ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනවිරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් මිලියන දෙකයි හාරලක්ෂ අනූහතර දහස් දෙසීය දහනවයයි ශත විසිනවයක් වූ (රු. 24,94,219.29) මුදලක් සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් මිලියන දෙකයි එක්ලක්ෂ විසිහතර දහස් නවසිය අසූ පහක් (රු. 21,24,985) වූ මුදලක් සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතයි දශම පහක (7.5%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී අංක 23320 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් මිලියන දෙකයි හාරලක්ෂ අනූහතරදහස් දෙසිය දහනවයයි ශත විසිනවයක (රු. 24,94,219.29) මුදල සහ 2010 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් මිලියන දෙකයි එක්ලක්ෂ විසිහතර දහස් නවසිය අසූපහක් (රු. 21,24,985) වූ මුදල සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සති දොළහක කාලයක් සඳහා බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතයි දශම පහක (7.5%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු සහ විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව ඉහත කී උකස් බැඳුම්කරයේ නියමයන්ට අනුව ඩී. එෆ්. සී. සී බැංකුව විසින් වැයකර ඇති මුදල් සහ දරන ලද සියලු වියදම් සහ ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23320 දරන උකස් බැඳුම්කරය මගින් ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත සවිස්තර ලෙස විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුල්‍ය සංස්ථාව පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**අංක 23320 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, මහර උඃරුවල්පේරුව ප්‍රාදේශීය සභාවේ අංක 3 දරන උප කාර්යාල සීමාව තුළ අඹගස්පිටියේ පිහිටා ඇත්තාවූ ද "අස්වැද්දමේ කුඹුර" සහ "යාබද පිල්ලෑව" යනුවෙන් හඳුන්වනු ලබන්නාවූ ද බලයලත් මිනින්දෝරු එස්. පී. එන්. සඳගිරි විසින් සාදන ලද 2004.07.17 දින අංක 1074 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණුකර ඇත්තාවූ ද, උතුරට : ඩී. පී. ප්‍රේමරත්න විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, නැගෙනහිරට : බී. චන්ද්‍රලතා සහ තවත් අය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, දකුණට : යක්කල කිරිඳිවල ප්‍රධාන මාර්ගය ද, බටහිරට : ඩී. නිමලසිරි, තුසිත ජයන්ත්මාල් සහ බී. පියසීලි යන අය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද යන මායිම් තුළ පිහිටියාවූ ද, ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඊ 759/42 දරන පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද එකී අංක 1074 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස්හයයි දශම එකක් වූ ද (අ. 0, රූ. 0, පර්. 36.1) වූ ද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

12-98/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡෙදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡෙදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡෙද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡෙදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡෙදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡෙද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| දෙසැම්බර් | 2010.12.03 | සිකුරාදා | 2010.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.10 | සිකුරාදා | 2010.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.17 | සිකුරාදා | 2010.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.24 | සිකුරාදා | 2010.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.31 | සිකුරාදා | 2010.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2011** | | | |
| ජනවාරි | 2011.01.07 | සිකුරාදා | 2010.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.14 | සිකුරාදා | 2010.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.21 | සිකුරාදා | 2011.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.28 | සිකුරාදා | 2011.01.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2011.02.03 | බ්‍රහස්තින්දා | 2011.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.11 | සිකුරාදා | 2011.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.18 | සිකුරාදා | 2011.02.03 | බ්‍රහස්තින්දා | දහවල් | 12.00 |
| | 2011.02.25 | සිකුරාදා | 2011.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.